**සිංහල සාහිත්‍ය රසාස්වාදය**

**11 ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය - 2024**

**පිළිතුරු පත්‍රය**

**I පත්‍රය**

1. (I) (අ) කුස කුමරු/ ඔක්කාක රජුගේ වැඩිමහල් පුතා/ සීලවති බිසවගේ වැඩිමහල් පුතා
(ආ) කුස කුමරු විසින් තෙළන ලද රන් පිළිමය

(II) (අ) නන්ද තෙරුන්
(ආ) නන්ද තෙරුන් රහත්භාවයට පත්වීම

(III) (අ) මොනිකා රුවන්පතිරණ
(ආ) දෙපද ආකෘතිය

(IV) (අ) පොඩි මාමා/ සේතන් සිඤ්ඤෝ
(ආ) මහගෙදර වත්තෙහි වූ කොස් ගහ/ කොස් ගහ

(V) (අ) වැලපීම
(ආ) සුමානයකට පෙර තම පුතා මිය යාම/ පුතාගේ මරණය පිළිබඳ කිසිවකු තමාට සවන් නොදීම

2. (I)
- දිවුල් ලාටු මුසු වයිති තරව වැදගන්නා සේ
- මගුලෙන් හෙළාලු කප උගුළුවාලන්ට බැරියා සේ

(II) බුදුන් පිය රජුගේ මාළිගයට වැඩි ගමනේ දී ඔබගෙන් වෙන් කොට ගෙන නන්ද කැඳවා ගෙන යන බව

(III)
- දන් වළඳා අන්තයෙහි නන්ද කුමරුන් අතට දුන් පාත්‍රය ආපසු නොගැනීමෙන් විහාරයට ම නන්ද කැඳවා ගෙන යාම
- නන්ද කුමරු බුදුන් පිළිබඳ ගෞරවයෙන් පාත්‍රය හැරගන්නට නොකියා පසුපසින් විහාරයට ම යාම

(IV) ගවු, දෙගවු, සතරගවු පමණ මුව විට පළල ඇති පොළොව බොළ විතර උස ඇති නිධාන සැළ හතරෙක් ඇති බව
ලිහිල් බසින් ලියා තිබුණ ද පිළිගන්න

**නැතහොත්**

(I) **''එයින් පිටත්තර වෙන විදියකින් නොවේ''**

**''අයුත්තකට අත් දෙක ඔසවන්ට එපා''**
අදාළ වෙනත් පිළිතුරු ලියා ඇති විට පිළිගන්න

(II) අනුප්‍රාසය/ අනුප්‍රාසාලංකාරය

(III) **''ඉතින් අඬ ගසව්''/ ''ඉතින් යමව්''** ආදි විධි ක්‍රියා භාවිතය

**''අයුත්තකට අත් දෙක ඔසවන්ට එපා''**
**''නිලධාරීන්ට විශ්වාසය දෙන්ට එපා''** } දැඩි නියෝග භාවිතය

**''බියෙන් තැති ගැනුම අප හට තරම් නොවේ''** - තමා තුළ ස්ථාවරත්වය ආදි ගැලපෙන වෙනත් පිළිතුරු පිළිගන්න

(IV) **''බියෙන් තැති ගැනුම අප හට තරම් නොවේ''**

**''බියෙන් නොගොස් අහු මුළුවල රිංගන්ට''**

**''කතත් කමක් නැත, බියසුලු ගතිය පපා**
**අයුත්තකට අත් දෙක ඔසවන්ට එපා...''**
ආදි උදාහරණ භාවිතයෙන් පැහැදිලි කර තිබිය යුතුය

## <u>II පත්‍රය</u>

01.

- ජීවිතය පිළිබඳ/ නොනවතින සංසාරික ගමන පිළිබඳ ඉඟියක්

- නිසදැස් ආකෘතිය - උදාහරණ මඟින් පෙන්වා දිය යුතුය

- සරල භාෂාවක් - **''මඟක් නම් පියවර මතින් පියවර තබා...''**
  වියත් භාෂාවක් - **''සියදහස් කෝවේ'', ''ඉසිඹු''**
  සංකේත භාවිතය - අම්බලම්/ විසිතුරු සල්පිල්/ වටරවුම් ආදිය

- සංසාරික ගමන් මගේ නිමාවක් නැතිබව
  **''මොහොතක ඉසිඹ ලබනා විනා. නැත අතරමග නතර වන වාසනා''**
  ජීවිතයේ විවිධ අවස්ථා උදාවන බව/ එක සමානව ගලා නොයන බව

- සරලව සංක්ෂිප්තව පද්‍ය පන්තිය ගලාගෙන යාම
  නිසදැස් ආකෘතිය භාවිතය
  සංකේතාර්ථ භාවිතය
  වියත් වදන් භාවිතය

02. **''තඹුරු වනය මුකුලිත වන බව සවස**
**කවුරු විසින් වැළකිය හැකි මෙදිය කුස''**

**''ගල කෙටු අකුරක් මෙන්''**
**''දිය පිට ඇඳි ඉරක් ලෙද''** ආදි උපමා භාවිතය

''වෙසෙස් සිනිඳු <u>**මුව රද බර සහස් පත**</u>
<u>**කොරොස් නලින්**</u> යුතු වෙයි කටු පෙළහි යුත''

03. හිරු උදාවට/ උදෑසනට අප්‍රිය කරන/ වෛර කරන පුද්ගලයෙකුගේ සිතිවිල්ලක් ලෙසින්

- කළු රෙදි පොරවනය තීරුවලට ඉරා දැමීම
- කුරුල්ලන් බිය වීම
- මල් පොහොට්ටු තිගැස්සීම

04. - වී ගොවිතැන කිරීමේ දී මුහුණ දෙන දුෂ්කරතා
**''ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ''**

- පයින් ගමන් බිමන් යාම/ අම්බලම් භාවිතය
**''අල්ලාගෙන නෙරිය අතකින් කිම් ද නගෝ''**

- දරුවන් විසින් නොසලකා හරිනු ලැබුවන්ගේ අඳෝනා
**''බඩගිනි වෙලා මා ගිය කල පුතුගේ ගෙට''**

- ජන ක්‍රීඩා පිළිබඳව
**''දොඩම් කපාලා ඇඹුල් තනාලා''**

ආදි වෙනත් ගැලපෙන පිළිතුරු පිළිගන්න

05. - පුතුගේ මිය යාම පිළිබඳ කම්පා වන පියෙක්
**''ඔහු ඉන්නේ හිම කන්දක් තමා වෙත කඩා වැටුණත් ඉන් ගැලවීමට උවමනාවක් නැත්තකු මෙනි''**

- තම අශ්වයා පිළිබඳ අනුකම්පාවක්
**''මට තාම කඩල මිලවත් හොයාගන්න බැරි උණා''**

- උපේක්ෂාවෙන් සියල්ල දරාගත් බව
**''මට දැන් ඇත්තේ මගේ ගැනිත්, තෙත පොළවත් විතරයි''**

- තමාගේ රැකියාවට මුදල් මත ම පමණක් යැපෙන්නක් නොවීම
**''ග්‍රිවෙනික් දෙක ගමනට නොසෑහේ. එහෙත් රූබලයක් වුවත් කොපෙක් පහක් වුවත් ඔහුට නම් වෙනසක් නැත''**

- තම මගීන් පිළිබඳ ඇති හැඟීම
**''මුන්නැහැලා සෙල්ලක්කාර තරුණ මහත්තුරු. උන්නැහලාට දෙයියන්ගේ පිහිටයි !''**